# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1898/28 - 2015 ජනවාරි මස 20 වැනි අඟහරුවාදා - 2015.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

**නිවැරදි කිරීම**

2014.10.01 දිනැති අංක 1882/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටස - පළාත් සභා *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද නිවාස දේපළ සංවර්ධනය සහ ඉඩම් කට්ටි කර විකිණීමට අදාළ අතුරු ව්‍යවස්ථාවේ පහත වගන්ති මෙයින් නිවැරදි කරමි.

03. 02. (අ) කට්ටි කිරීමට යෝජිත ඉඩම හෙක්ටයාර් 02 කට වැඩි පොල් ඉඩමක් නම් ඒ සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ලබා ගන්නා අනුමැතිය.

(ආ) හෙක්ටයාර් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක ඉඩමක් කොටස් කරන අවස්ථාවේදී එසේ කොටස් කිරීමෙන් පරිසර හානියක් නොමැති බවට වයඹ පළාත් සභාවේ වයඹ පළාත් පරිසර අධිකාරියෙන් ලබා ගන්නා ලද වාර්තාව.

04.1. එසේ ඉදිරිපත් වන ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් හෙක්ටයාර් 0.2 සිට හෙක්ටයාර් 4 දක්වා හෙක්ටයාර් 4 ද ඇතුළත් වන පරිදි වූ ඉඩම් ප්‍රමාණයක් සඳහා වන අයදුම්පතකට අදාළව ඊට අදාළ කොන්දේසි සපුරා ඇති අවස්ථාවක පළාත් පාලන ආයතනය විසින් අනුමැතිය ලබා දිය හැකි වන්නේය.

2. එසේ ඉදිරිපත් වන ඉල්ලුම්පතකට හෙක්ටයාර් 4 ට වැඩි වන හා හෙක්ටයාර් 10 දක්වා හෙක්ටයාර් 10 ද ඇතුළත් වන පරිදි වූ ඉඩම් ප්‍රමාණයක් සඳහා වන අයදුම්පතකට අනුමැතිය ලබා දීමට ප්‍රථමයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගේ සහ විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ ලබා ගත යුත්තේය.

3. වගන්තිය ඉවත් කෙරේ.

08. (1) කොටස් කරන ලද ඉඩම් ඇතුළත වෙන් කෙරෙන සියළුම පාරවල් මෙහි පහත සඳහන් පිරිවිතවලට අනුකූලව විය යුතුය.

| *ඉඩම් කැබලි සංඛ්‍යාව* | *පාරේ පළල (මීටර්)* |
|---|---|
| 04 ක් හෝ ඊට අඩුවන විට | 4 |
| 05 සිට 08 දක්වා | 5 |
| 09 සිට 20 දක්වා | 6 |
| 20 ට වැඩි වන විට | 9 |

නීතිඥ ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන හා පළාත් පරිපාලනය, මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
ඉඩම්, පරිසර, සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ,
සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍ය.

2014 නොවැම්බර් මස 28 දින,
කුරුණෑගලදීය.

02 - 71

---

## නිවැරදි කිරීමයි

### බස්නාහිර පළාතේ 2014 අංක 04 දරන මුදල් (සංශෝධිත) ප්‍රඥප්තිය

2014.12.23 දින හා අංක 1894/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද වගන්තිවල සඳහන් මුද්‍රණ දෝෂ පහත සඳහන් ආකාරයට නිවැරදි විය යුතුය.

1. පළමු වන වගන්තියේ ‘‘අනුමත” යන්න ‘‘අනුමතය” යනුවෙන්ද, දෙවන වගන්තියේ දීර්ඝ නාමයේ අවසානයේ සඳහන් ‘‘අනනුකූලව” යන්න ‘‘අනනුකූලවේ” යනුවෙන් ද, 97 අ වගන්තියේ 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු ‘‘(සංශෝධිත)” යන්න ‘‘(සංශෝධන)” යනුවෙන්ද, 97 ආ වගන්තියේ පැති වාක්‍යයේ "පලාත් " යන්න "පළාත් " යනුවෙන්ද,

නිවැරදි විය යුතුය.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය
සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා,
ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍ය.

2014 දෙසැම්බර් මස 24 දින.

02 - 74

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.